Wondershare PDFelement

**තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව**
**වෘත්තීය දැනුම ඇගයීමේ පරීක්ෂාව- 2022 ජූලි**
**පෙරපාසල් ගුරු**
**ජාතික වෘත්තීය සුදුසුකම - 4 වන මට්ටම**

**කාලය - පැය 1 1/2**

**විභාග අපේක්ෂකයන් හට උපදෙස්**

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 50 දක්වා වූ ප්‍රශ්නවල , දී ඇති (a), (b), (c), (d) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න
- මෙම ප්‍රශ්න පත්‍රයෙහි පිටු 07ක් අඩංගු වේ.

---

## 1 කොටස

1. හසුරු කුසලතා සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ;
   a) ශ්‍රවණය, කථනය පිළිබඳ අවබෝධය ලබාදීමයි
   b) ඇස් හා අත සමායෝජනය කිරීම
   c) දැනුම/ ආකල්ප පිළිබඳ ඇගයීම් කිරීම
   d) දෘෂ්ඨිය, ශ්‍රවණය පිළිබඳ අවබෝධ කිරීම

2. සෞන්දර්ය හා නිර්මාණය පිළිබඳ හඳුන්වාදීම සඳහා කළයුත්තේ;
   a) ගායනය හා වාදනය තුල රස වින්දනය ඇති කිරීම
   b) පරිසරයේ විවිධ ශබ්ද වලට ඇහුම්කන් දීමට යොමු කිරීම
   c) කවි, කතාන්දර වල කොටස් සම්පූර්ණ කිරීමට මඟ පෙන්වීම
   d) තමා විසින්ම නිර්මාණය කරගත් සංගීත භාණ්ඩ වාදනය කිරීම

3. පහත අරමුණු අතුරින්, පෙර පාසල් අධ්‍යාපනයේ අරමුණු වන්නේ;
   i). සංවේදී ඉන්ද්‍රියයන් නිසිලෙස ලෙස පාලනය කිරීම
   ii). බුද්ධිය, දැනුම වැඩිකර ගැනීමට සහාය දැක්වීම
   iii). කියවීම, ලිවීම සඳහා ඉන්ද්‍රිය සම්බන්ධීකරණය කිරීම
   iv). පැන්සල නියම ලෙස ඇල්ලීමට අත හුරු කිරීම
   මින් නිවැරදි වන්නේ;
   a) i, ii, iii
   b) i, ii, iv
   c) i, iii, iv
   d) ii, iii, iv

4. පිළිවෙළක් නොමැතිව හෝ අහඹු ලෙස කුරුටු ගෑමේ අවධිය, අවුරුදු වලින් වන්නේ;
   a) 2- 2 1/2
   b) 2 1/2- 3
   c) 3-4
   d) 4-7

5. ළමා සංවර්ධනයට වඩාත්ම බලපාන සාධක වන්නේ;
   a) පෝෂණය, නින්ද, පාසැල, පරිනතිය
   b) ආදරය, වර්ධනය, පෝෂණය, ඖෂධ
   c) ව්‍යායාමය, පෝෂණය, නින්ද, ආහාර
   d) ආරය, පරිසරය, පරිනතිය, ඉගැනුම

Wondershare PDFelement

6. ළමා සංවර්ධනයේ ප්‍රධාන ක්ෂේත්‍ර කාණ්ඩය වන්නේ;
   a) ගණිතමය, සෞන්දර්යය, කායික, චාලක
   b) සෞන්දර්ය, සමාජීය, කායික, චිත්තවේග
   c) කායික, චාලක, චිත්තවේග, ප්‍රජානන
   d) න්‍යායාත්මක, කායික, නිර්මාණ, ප්‍රජනන

7. ජීන් පියාජේගේ බුද්ධි සංවර්ධන න්‍යායට අනුව පූර්ව සංකල්පන අවධිය දැක්වෙන කාල සීමාව අවුරුදු වලින් වන්නේ;
   a) 0-2
   b) 2-4
   c) 4-7
   d) 7-11

8. ළමා විමුක්තිදායකයා යනුවෙන් විරුදාවලිය ලබා ඇත්තේ;
   a) අයිවන් පැව්ලොව් ය
   b) මහත්මා ගාන්ධිය
   c) ජෝන් ඩුවි ය
   d) ජීන් ජැක් රූසෝ ය

9. ප්‍රකාරක න්‍යායයට අනුව ඉගෙනීම තුල වැදගත් වන්නේ;
   a) උපස්ථම්භකය
   b) උත්තේජය
   c) ආකල්පය
   d) සාරධර්මය

Wondershare PDFelement

10. ළදරුවකුට මව්කිරි ලබාදිය යුතු අනිවාර්ය මාස ගණන වන්නේ;
   a) 03කි
   b) 04කි
   c) 05කි
   d) 06කි

11. පියාජේට අනුව පූර්ව සංකල්පන අවධියේ දරුවකු තුල දැකිය හැකි ලක්ෂණයක් වනුයේ;
   a) කල්පිත ගොඩනැගීම සිදුකරයි
   b) සංකේතාත්මකව ක්‍රියා කිරීම අරඹයි
   c) තර්කානුකූල සිතීම ආරම්භ කරයි
   d) සංරක්ෂණයට හුරු බවක් පෙන්වයි

12. ප්‍රධාන කළමණාකරණ ක්ෂේත්‍රයක් වන්නේ;
   a) පිරිස්
   b) තත්ත්ව
   c) මූල්‍ය
   d) ලේඛණ

13. චිත්තවේග කළමණාකරණය ඉදිරිපත්කරන ලද්දේ;
   a) ඩැනියෙල් ගෝල්මන්
   b) ජීන් ජැක් රූසෝ
   c) ඇල්බට් බන්ඩුරා
   d) ආනෝල්ඩ් ගෙසල්

Wondershare PDFelement

14. මූලික හැඩතල තුනක් වන්නේ;
    a) ත්‍රිකෝණය, රවුම, කේතුව
    b) කේතුව, ඝනකය, සමචතුරස්‍රය
    c) සමාන්තරාස්‍රය, රවුම, ත්‍රිකෝණය
    d) ඍජුකෝණාස්‍රය, රවුම, ත්‍රිකෝණය

15. සැහවුණු කුසගින්න ඇතිවනුයේ කුමන පෝෂ්‍ය පදාර්ථය ඌන වීමෙන්ද?
    a) විටමින්
    b) ඛණිජ ලවණ
    c) ලිපිඩ
    d) පිෂ්ඨය

16. ස්පර්ශයෙන් ඉගෙනීම සඳහා භාවිතාකල හැකි ක්‍රමවේදයක් වන්නේ;
    a) රෝස අටල්ල
    b) වැලි කඩදාසි  අක්ෂර
    c) තිර රාමු
    d) ප්‍රහේලිකා

17. කුඩා ළමයාට ලබාදිය යුතු මූලිකම අවශ්‍යතාවයක් වන්නේ;
    a) නිදහස
    b) ආරක්ෂාව
    c) සුන්දරත්වය
    d) ආදරය

18. බුද්ධි සංවර්ධනයේදී “සම්බන්ධතාවය” තුල අන්තර්ගත වන්නේ;
    a) වර්ගය, සමානතාවය, අයිතිය, සංසන්දනය
    b) විවිධත්වය, අයිතිය, වර්ගය, ප්‍රමාණය
    c) සමානතාවය, අයිතිය, තේරීම, සංවිධානය
    d) අයිතිය, ප්‍රමාණය, වර්ගය, සමානතාවය

Wondershare PDFelement

19. ශක්ති ජනක ආහාර ගණයට අයත් වන්නේ;
    a) ප්‍රෝටීන්, ලිපිඩ
    b) පිෂ්ඨය, ලිපිඩ
    c) විටමින්, පිෂ්ඨය
    d) ඛණිජ, ප්‍රෝටීන්

20. පෙර කියවීම සංවර්ධනය සඳහා ලබාදිය යුතු ක්‍රියාකාරකමක් වන්නේ;
    a) වමේ සිට දකුණට ඇස හුරු වීම
    b) අවධානයෙන්/ අවබෝධයෙන් සවන්දීම
    c) හුරු පුරුදු දෛනික සිද්ධි විස්තර කිරීම
    d) සිසුන් අතර සරල පණිවිඩ ගෙන යෑම

21. පෙර පාසැල් දරුවාගේ චිත්‍ර නිර්මාණ ඇගයීම්කරණයේදී වඩාත් අවධානය යොමුකල යුත්තේ;
    a) පාඩම් සැලැස්ම තුල සඳහන් නිර්මාණ සමඟ
    b) එම දරුවා විසින්ම කලින් කරන ලද නිර්මාණ සමඟ
    c) තේමාව තුල ඉගෙනුම් ඵලය නිර්මාණ සමඟ
    d) අනෙක් දරුවන්ගේ නිර්මාණ සමඟ

Wondershare PDFelement

22. දරුවාට පරිසරය තුල සාරවත් අත්දැකීම් ලබාදීම සඳහා කලයුතු වන්නේ;
    a) ස්වාභාවික සිද්ධි සම්බන්ධව අත්දැකීමක් ලබාදීම
    b) චිත්‍ර තුලින් පරිසර අවස්ථාවලට යොමු කිරීම
    c) පරිසරයේ ඇති විවිධ ද්‍රව්‍ය නිරීක්ෂණයට යොමු කිරීම
    d) පරිසරය පිරිසිදුවට තබා ගැනීමට අවස්ථා සැලසීම

23. ශරීරයේ විශාලතම ඉන්ද්‍රිය වනුයේ;
    a) ඇස
    b) කණ
    c) සම
    d) මොළය

24. පෙර පාසැලකට ඇතුලත්කර ගන්නා දරුවන්, .................. සම්පත් කළමණාකරණයට අයත්ය
    a) මානව
    b) මූල්‍ය
    c) භෞතික
    d) පිරිස්

25. සංස්කෘතික රටා න්‍යාය තුල ප්‍රධාන වශයෙන්ම දැකිය හැකි වනුයේ;
    a) සමාජානුයෝජනය
    b) චාරිත්‍ර වාරිත්‍ර
    c) කණ්ඩායම් හැඟීම
    d) ආකල්ප

26. රක්තහීනතාවය ඇතිවීමට බලපාන රුධිරයේ සංඝටකය වනුයේ;
    a) ග්ලූකෝස්
    b) ඇමයිනෝ අම්ලය
    c) ග්ලිසරෝල්
    d) හිමෝග්ලොබින්

27. වර්ධක ආහාර වල අඩංගු මූලද්‍රව්‍ය වන්නේ;
    a) කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන්, සල්ෆර්
    b) කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන්, නයිට්‍රජන්
    c) කාබන්, නයිට්‍රජන්, මැග්නීසියම්, ඇළුමිනියම්
    d) කාබන්, නයිට්‍රජන්, සල්ෆර්, පොස්පරස්

28. මුද්‍රිත ජන මාධ්‍යයක් වන්නේ;
    a) ගුවන් විදුලිය
    b) මුහුණු පොත
    c) සඟරා
    d) සිනමාව

29. බහු විධ බුද්ධිය ඉදිරිපත් කරන ලද්දේ;
    a) ජීන් පියාජේ
    b) ඩේවිඩ් වෙස්ලර්
    c) හොවාර්ඩ් ගාඩ්නර්
    d) මාග්‍රට් මැක්මිලන්

Wondershare
PDFelement

30. BCG එන්නත ලබාදෙන්නේ;
    a) ජර්මන් සරම්ප වලටය
    b) ක්ෂය රෝගයටය
    c) පාචනයටය
    d) ජල භීතිකාවටය

31. ක්‍රීඩා ක්‍රියාකාරකම් මගින් පෙර පාසල් දරුවන් තුල වැඩි වශයෙන්ම වර්ධනය කල හැක්කේ;
    a) කණ්ඩායම් හැඟීම්
    b) සමාජානුයෝජනය
    c) තර්කානුකූල සිතීම
    d) මතක ශක්තිය

32. "ඇට දමන ලද බෑගය" දරුවාගෙන් දරුවාට පිටුපසට විසි කරයි. මෙම ක්‍රියාකාරකම තුළින් සංවර්ධනය වනුයේ;
    i). දළ චාලක ක්‍රියාකාරකම්
    ii). මුළු ශරීරයම ක්‍රියාත්මක කිරීමයි
    iii). අනෙකා අභිබවා කටයුතු කිරීමයි
    iv). තම අවස්ථාව එනතුරු බලා සිටීමයි

මින් නිවැරදි වන්නේ;
    a) i,ii,iii
    b) i,ii,iv
    c) i,iii,iv
    d) ii,iii,iv

33. අසර යන ගණිත සංකල්පයෙන් පැහැදිලි වනුයේ;
    a) දුරස්ථභාවය
    b) වෙනස්වන බව
    c) සාපේක්ෂ පිහිටීම
    d) සම්බන්ධය

34. පරිසර ගවේෂණය ලෙස හඳුන්වන්නේ;
    a) පරිසරය සමඟ අන්තර්ක්‍රියා කිරීම
    b) පරිසරය නිරීක්ෂණය කිරීම
    c) පරිසරයේ යථා තත්ත්වය තේරුම් ගැනීම
    d) පරිසරය පිළිබඳ අවබෝධ කිරීම

35. "ක්‍රීඩාවෙන් ඉගැනුම" හඳුන්වාදෙන ලද්දේ;
    a) ෆෙඩ්‍රික් ෆීබෙල් (Fredrick Friable)
    b) ලූරියා විගොට්ස්කි (Luria Vygotsky)
    c) අයිවන් පැව්ලොව් (Ivan Pavlov)
    d) ජෙරමි බෲනර් (Jeremy Browner)

36. සමාජ පරිසරයට අයත් වන්නේ;
    a) වටිනාකම්, සංස්කෘතිය, පුරුදු, චාරිත්‍ර
    b) සංස්කෘතිය, පුරුදු, ආකල්ප, විනය
    c) වටිනාකම්, ආකල්ප, විශ්වාස, විනය
    d) සංකල්ප, විනය, ආකල්ප, පුරුදු

Wondershare PDFelement

37. සෞඛ්‍ය නිර්වචනය වන්නේ;
   a) කායික, මානසික, සමාජ, චිත්තවේග, සුභසාධනය
   b) කායික, මානසික, ප්‍රජනන, පාරිසරික සුවතාවය
   c) අධ්‍යාත්මික, බුද්ධිමය, කායික, සමාජමය සුභසාධනය
   d) කායික මානසික, අධ්‍යාත්මික, සමාජීය සුභසාධනය

38. ශ්‍රවණ ඌනතා දරුවන් සඳහා ලබාදිය යුතු අධ්‍යාපනික උපකරණය වන්නේ;
   a) බ්‍රේල් උපකරණය
   b) භාෂා උපකරණ
   c) ශ්‍රවණාධාරක
   d) ශබ්ද පෙට්ටි

39. දස පනත / පංච විරති ගැන සඳහන් කරන ආගම් පිළිවෙළින් වනුයේ;
   a) හින්දු ආගම, කිතුණු ආගම
   b) බුදු දහම, හින්දු දහම
   c) කිතුණු දහම, නිගණ්ඨ දහම
   d) කිතුණු දහම, ඉස්ලාම් දහම

40. ස්කිමා යනු;
   a) මනෝ රටා ව්‍යුහය
   b) චිත්තවේගී අවස්ථාවකි
   c) සිතේ ඇතිවන හැඟීමකි
   d) බුද්ධිමය සංකල්පයකි

41. සතර අභිනයන්ට අයත් වන්නේ;
   a) සාත්වික අභිනය
   b) තාත්වික අභිනය
   c) අතාත්වික අභිනය
   d) අභිරූපන අභිනය

Wondershare PDFelement

42. බ්ලූම්ගේ න්‍යායට (Theory of bloom) අයත් වන්නේ;
   a) තීන්දුව
   b) පරිකල්පනය
   c) තීරණය
   d) අවබෝධය

43. "ආවේදනීය ක්ෂේත්‍රය" පිළිබඳ සඳහන් කිරීමේදී සනාථ කළ හැක්කේ;
   a) ඇගයීම
   b) ආකල්ප
   c) මනෝචාලක
   d) භාවිතය

44. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකින් පසු කරනු ලබන තක්සේරුව හඳුන්වන්නේ;
   a) සම්භවන
   b) සම්පිණ්ඩිත
   c) අන්වායාම
   d) තිරියක්

Wondershare
PDFelement

45. සමාජානුයෝජනයේ ප්‍රාථමික කාරකයක් වන්නේ;
    a) පාසැලය
    b) ජනමාධ්‍යයයි
    c) පවුලය
    d) ආගමික ස්ථානයයි

46. දරුවාගේ අක්ෂි ඌනතා සඳහා ප්‍රධාන වශයෙන්ම බලපෑම් ඇති කරන විටමිනය වන්නේ;
    a) A
    b) B
    c) C
    d) D

47. අවධානයෙන් සවන්දීමේ හුරුව ඇති කිරීම සඳහා පෙර පාසැල තුල කරනු ලබන ක්‍රීඩාවක් වන්නේ;
    a) කැරම් ගැසීම
    b) දිය ගොඩ
    c) පංච දැමීම
    d) ඔන්චිලි පැදීම

48. විශේෂ අවශ්‍යතා දරුවන්ගේ තොරතුරු ලබාගන්නා ක්‍රමයක් වන්නේ;
    a) ප්‍රත්‍ය අධ්‍යයනය
    b) ජීව ලේඛණ වාර්ථා
    c) සම්මුඛ පරීක්ෂණ
    d) සම්පරීක්ෂණ වාර්ථා

49. පෙර ලිවීමේ ක්‍රියාකාරකම් සඳහා වැදගත් වන්නේ;
    a) පරිසර මුල්ල
    b) වැලි පීල්ල
    c) පොත් මුල්ල
    d) සෞන්දර්ය මුල්ල

50. අවප්‍රමාණ චර්යා ඇතිවීමට හේතු වන්නේ;
    a) සමාජානුයෝගී දුර්වලතා
    b) ආකල්ප වර්ධනය නොවීම
    c) බුද්ධි සංවර්ධනය නොවීම
    d) ඉහත සියල්ල

(01 x 50 = ලකුණු 50)

Wondershare
PDFelement

Wondershare PDFelement

*සියළුම හිමිකම් ඇවිරිණි*

**තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව**
**වෘත්තීය දැනුම ඇගයීමේ පරීක්ෂාව- 2022 ජූලි**
**පෙරපාසල් ගුරු**
**ජාතික වෘත්තීය සුදුසුකම - 4 වන මට්ටම**

**කාලය - පැය 1 1/2**

**විභාග අපේක්ෂකයන් හට උපදෙස්**

- පළමු (01) ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. (පළමු (01) ප්‍රශ්නය අනිවාර්ය වන අතර පිළිතුරු ලබාදිය යුතු මුළු ප්‍රශ්න ගණන හතරක් (04) විය යුතුය).
- මෙම කොටස සඳහා පිළිතුරු සැපයීම සඳහා, ප්‍රශ්න පත්‍රයේ දී ඇති ඉඩ භාවිතා කරන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයෙහි පිටු 06ක් අඩංගු වේ.

---

## 2 කොටස

1.

i). සමෝධානික ඉගෙනුම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 03)

ii). පෙර පාසල් වයස (අවුරුදු 4-5) සිසුන්ට ගැලපෙන සේ සමෝධානික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය භාවිතා කරමින් "අහස" යන තේමාවට අදාලව සමෝධානික ඉගැනුම් සැලැස්මක් (පාඩම් සැලැස්මක් නොවේ) ඇඳ දක්වන්න. (ලකුණු 12)

Wondershare PDFelement

Wondershare
PDFelement

iii). ඔබ විසින් ඉදිරිපත්කල ඉගැනුම් සැලැස්ම පදනම් කරගනිමින් පාඩම ක්‍රියාත්මක කිරීමෙන් සිසුන්ට සැලසෙන වාසි තුනක් (03) දක්වන්න (ලකුණු 05)

2.

i). විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සංකල්පය පැහැදිලි කරන්න (ලකුණු 02)

Wondershare
PDFelement

ii). සුලභ ඉන්ද්‍රීය ඌනතා වර්ග දෙකක් (02) නම්කර ඒ එකිනෙක සැකවින් විස්තර කරන්න (ලකුණු 04)

Wondershare
PDFelement

iii). පන්ති කාමරය තුලදී ඉන්ද්‍රීය දුබලතා සහිත ළමුන්හට ගුරුවරිය විසින් උපකාර කරන්නේ කෙසේදැයි කරුණු හතරකින් (04) දක්වන්න (ලකුණු 04)

3.

i). ඉගෙනුම් න්‍යායයන් පිළිබඳව ගුරුවරුන්ගේ දැනුමෙහි වැදගත්කම පෙර පාසැල් දරුවාට ගලපන්නේ කෙසේදැයි කරුණු තුනක් (03) ඇසුරින් දක්වන්න (ලකුණු 05)

Wondershare
PDFelement

Wondershare
PDFelement

ii). ඔබ දන්නා ඉගෙනුම් න්‍යායයක් භාවිතාකරමින් කුඩා දරුවාට ඉගැන්වීම් පහසු කරන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)

4. පෙර පාසැල් දරුවාට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුල "සාරධර්ම" සහිත පරිසරයක් නිර්මාණය කිරීම වඩාත් වැදගත් වේ.

i). සාරධර්ම යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි උදාහරණ එක් කරමින් කරුණු පහක් (05) පහදන්න (ලකුණු 05)

Wondershare
PDFelement

Wondershare
PDFelement

ii). "සාරධර්ම පරිසරය" තුල දරුවාට ලබාදිය හැකි වාසිදායක තත්ත්වය පහදන්න (ලකුණු 05)

Wondershare
PDFelement

5.

i). මාරියා මොන්ටිසෝරි අධ්‍යාපනයේ ප්‍රතිපත්ති හතර (04) දක්වන්න (ලකුණු 04)

ii). “අද පෙර පාසල තුල මාරියා මොන්ටිසෝරි මැතිනියගේ අධ්‍යාපනික සංකල්ප කොතෙක් දුරට ඉවහල් වේද" යන්න පැහැදිලි කරන්න (ලකුණු 06)

Wondershare PDFelement

6. පහත මාතෘකා හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න (2.5 x 4 = ලකුණු 10)

i). ඉගෙනුම
ii). පරිනතිය
iii). ප්‍රජානනය
iv). ළමා සංවර්ධනය
v). ආරය හා පරිසරය